# සීමාසහිත තිස්සමහාරාම විවිධ සේවා සමුපකාර සමිතිය

# තනතුරු පුරප්පාඩු

සීමා සහිත තිස්සමහාරාම විවිධ සේවා සමුපකාර සමිතියේ අනුමත පිරිස් බල තක්සේරුව අනුව පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරාලන සමිති බල ප්‍රදේශයේ පදිංචි අයගෙන් 2026.11.06 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුර** | **පරිගණක දත්ත ක්‍රියාකරු** |
|---|---|
| **කේත අංකය** | OPL-2 |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 18 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | ගණිතය සහ සිංහල / දෙමළ භාෂාව, ඇතුළු විෂයයන් 03 කට සම්මාන සහිතව අ.පො.ස. සා/ පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම සහ රජයේ ලියාපදිංචි පිළිගත් ආයතනයකින් NVQ III මට්ටමේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සහතිකයක් ලබා තිබීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ පරිගණක දත්ත ක්‍රියාකරු තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම. |
| **I ශ්‍රේණිය** | II ශ්‍රේණියේ පරිගණක දත්ත ක්‍රියාකරු තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම. |

- **වැටුප් පරිමාණය :** (OPL-2) 34,000 - 400x5 - 500x5-600x10-700x10-800x12 - 61,100

| **තනතුර** | **කළමනාකරණ සහකාර** |
|---|---|
| **කේත අංකය** | OPL-2 |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 18 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | සිංහල / දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 03 කට සම්මාන සහිතව අ.පො.ස. සා/පෙළ විභාගයෙන් ගණිතය විෂය ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හෝ අ.පො.ස. උ/පෙළ විභාගය ඕනෑම විෂය ධාරාවකින් සමත් වීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම. |
| | MSL - I තනතුරක වසර 05 ක සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම. |
| **I ශ්‍රේණිය** | II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ පාඨමාලාව / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම. |

- **වැටුප් පරිමාණය :** (OPL-2) 34,000 - 400x5 - 500x5-600x10-700x10-800x12 - 61,100

| **තනතුර** | **රියදුරු** |
|---|---|
| **කේත අංකය** | MSL-1 |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 22 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | අ.පො.ස. සා/පෙළ විෂයන් 06 කින් සාමාර්ථය සහ වසර 03 ක් පැරණි අදාළ පන්තියේ රියදුරු බලපත්‍රය සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ රියදුරු තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| **I ශ්‍රේණිය** | III ශ්‍රේණියේ රියදුරු තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

- **වැටුප් පරිමාණය :** (MSL-1) 32,500 - 290X5 - 340X5 - 390X10 - 440X10 - 490X12 - 49,830

| **තනතුර** | **අත් උදව්කරු** |
|---|---|
| **කේත අංකය** | MSL-3 |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 18 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ අදාළ තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| **I ශ්‍රේණිය** | II ශ්‍රේණියේ අදාළ තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

- **වැටුප් පරිමාණය :** (MSL-1) 31,000 - 250X5 - 300X5 - 350X10 - 400X10 - 450X12 - 46,650

වෙනත් සමුපකාර සමිතිවල දැනට සේවයේ නියුතු අය සඳහා වයස් සීමාවක් බල නොපාන අතර, එම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත යොමු කළ යුතුය. තවද සමුපකාර සමිතියක සේවය කරන අතරතුර සෘජුව අයදුම්පත් එවා ඇති බැව් ඔහු තෝරාගත් පසුව වුවද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වේ.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් අදාළ සුදුසුකම් සනාථ කිරීමේ සහතික පිටපත් සමග 2026.11.06 දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "**ගරු සභාපති, සීමාසහිත තිස්සමහාරාම විවිධ සේවා සමුපකාර සමිතිය, තිස්සමහාරාම**" යන ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළයුතුය.

තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවන බව ද දන්වා සිටිමි.

- ඉහත තනතුරු සඳහා දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද වැටුප් පරිමාණ හා දීමනා ගෙවීම් කරනු ලබන අතර, එයට අමතරව සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්ත භාරකාර අරමුදල හා සමුපකාර සේවක විශ්‍රාම වැටුප්'දයකය ද හිමි වේ.

  **ගරු සභාපති,**
  **සීමාසහිත තිස්සමහාරාම විවිධ සේවා සමුපකාර සමිතිය, තිස්සමහාරාම.**
  **2026.10.21**

- ඉහත තනතුරු සඳහා දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද වැටුප් පරිමාණ හා දීමනා ගෙවීම් කරනු ලබන අතර එයට අමතරව සේවක අර්ථසාධ අරමුදල, සේවා නියුක්ත භාරකාර අරමුදල හා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් දයකය ද හිමි වේ.

**ගරු සභාපති,**
**සීමාසහිත තිස්සමහාරාම විවිධ සේවා සමුපකාර සමිතිය, තිස්සමහාරාම.**
**විමසීම් : 047-2237249**
**2026.10.22**